# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (භූගෝලවිද්‍යාව) - තෙවන භාගය

## දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය-2018/19

## GYG 4284 - ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධනය

කාලය : පැ 02 යි

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. i. සංවර්ධනය යන්න අර්ථ දක්වන්න. (ලකුණු 04)
   ii. ඌණ සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)
   iii. රටක සංවර්ධනය මැනීමේ නිර්ණායකයක් ලෙස ඒක පුද්ගල ආදායමේ වැදගත්කම විවේචනාත්මකව අගයුම් කරන්න. (ලකුණු 10)

2. i. කිසියම් රටක "ආර්ථික වර්ධනය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)
   ii. රටක සංවර්ධනය ක්‍රියාවලියේදී ආර්ථික වර්ධනය වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)
   iii. රොස්ටෝව්ගේ සංවර්ධන ආකෘතියෙහි ආර්ථික වර්ධනය පිළිබඳව පවතින ප්‍රධාන ලක්ෂණ උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 10)

3. i. ජාතික සැලසුම්කරණය හා ගැමි මට්ටමේ සැලසුම්කරණය අතර පවතින වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   ii. ශ්‍රී ලංකාවේ ජාතික සැලසුම්වලින් අපේක්ෂිත මට්ටමේ ප්‍රතිඵල නොලැබීමට බලපාන හේතු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)
   iii. "ජනතාව සමග සැලසුම්කරණයට" (Planning with peoples) අදාල ක්‍රමෝපායන් අනුගමනය කලහොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාව පවතී". උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. i. ව්‍යාපෘති යෝජනා වාර්තාවක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)
   ii. ව්‍යාපෘති යෝජනා වාර්තාවක ඇතුලත් විය යුතු ප්‍රධාන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 06)
   iii. ව්‍යාපෘතියක මූල්‍යමය විශ්ලේෂණයක් සිදු කිරීමේ පරමාර්ථ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5.

i. ව්‍යාපෘතියක සාද්‍යතා අධ්‍යයනයක් (Feasibility Study) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

ii. සාද්‍යතා අධ්‍යයනයකට ඇතුලත් විය යුතු ප්‍රධාන අංශ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර සාද්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

6. i. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයට බලපාන සංරෝධක මොනවාදැයි දක්වන්න. (ලකුණු 04)

ii. ඔබ ඉහත i කොටසේදී නම්කල සංරෝධක ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

iii. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා මෙම සංරෝධක අවම කිරීමට සුදුසු විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 10)

*****+++*****